# විනාශවෙමින් පවතින උපුල් වෙහෙර පුරාණ රජමහා විහාරයේ ඓතිහාසික වටිනාකම් අනාගතයට උරුමකරදීමේ අවශ්‍යතාව පිළිබඳ විමසුමක්

**ලක්ෂ්මන් එච්.ඩී.ඩී.ඩී.** [1]

වර්තමානය වන විට විනාශවීමේ තර්ජනයට ලක්ව ඇති උපුල්වෙහෙර පුරාණ රජමහා විහාරස්ථානයෙහි ඓතිහාසික වටිනාකම් පිළිබඳ විමසුමක් මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ. උපුල්වෙහෙර රජ මහා විහාරයෙහි ඓතිහාසික උරුමය කළමනාකරණය කොට අනාගතයට දායාද කිරීමේ උපයෝගීතාව කෙබඳුද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. මේ සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතා කරන ලද අතර ලබා ගත් දත්ත සන්සන්දනාත්මකව සහ විශ්ලේෂණාතමකව අධ්‍යයනය කරමින් නිගමනවලට එළඹී තිබේ. උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 664 උපුල් වෙහෙර ග්‍රාමයේ මෙම විහාරස්ථානය පිහිටා ඇත. ක්‍රි.පූ. 1, 2 සියවසට අයත් පුවරු ලිපියක් මෙම විහාරස්ථානයේ දක්නට ලැබේ. සතුන්ට ආහාර දැමීම වැනි අනාරක්ෂිත භාවිතාවන් හේතුවෙන් වර්තමානය වන විට මෙහි අක්ෂර කිහිපයක් හැර සෙසු කොටස් විනාශ වී ගොසිනි. ගඩොලින් සිදුකරන ලද ස්තූප, ගල් කණු හා ගල් කණු පාදම්, පියන සහිත ඇඹරුම් ගල, ගඩොල් බන්දේසියක කොටස් ආදී පෞරාණික අංග රැසක්ම මෙහි පවතී. මෙහි ගඩොලින් කරන ලද ස්තූපය ආශ්‍රිතව ද හානිකර තත්වයන් හඳුනාගත හැකිවිය. මුළු භූමිය පුරාම විහිදී පවතින ගල්කණු හා ගල් පාදම් අනුව මෙහි පෞරාණික ගොඩනැගිලි තුනක ඉදිකිරීම් අවශේෂ පවතී. විහාරස්ථානයේ කඳු වැටිය මුදුනෙහි ද ස්තූපයක් පවතින අතර වර්තමානයේ එය වනාන්තර ගත වූ පස් ගොඩැල්ලක් ලෙස දිස්වේ. අනවබෝධයෙන් සිදුකරන නඩත්තු කටයුතු මෙන්ම නිදන් සොරුන්ගේ තර්ජනයට ලක්වීම එහි පැවැත්මට එල්ල වී ඇති තර්ජනයක් ලෙස පැහැදිලි විය. හායන කාරකයන්ට ගොදුරු වීම සහ ඊට පිළියම් නොයෙදීම ආදිය මෙහි ඓතිහාසික උරුමයට එල්ල වී ඇති තර්ජනයන් ලෙස පැහැදිලි විය. ඒ සඳහා වගකිව යුත්තන්ගේ අවධානය යොමු වී මෙහි අවශ්‍ය සංරක්ෂණ කටයුතු ඉතා ඉක්මනින් ආරම්භ කිරීම ඉතා වැදගත් වේ.

**ප්‍රමුඛ පද :** හායනකාරක, උරුමය, කළමනාකරණය, අවශේෂ, සංරක්ෂණ

[1] ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. hiruniherathabeysekara@gmail.com